මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.11.30

# මාධ්‍ය නිවේදනයයි

1. දේශීය අර්තාපල් සහ ලොකු ළූණු ගොවීන්ට තම නිෂ්පාදනයන්හි පිරිවැය ආවරණය වන සාධාරණ මිලක් ලබාගැනීමට හැකිවන පරිදි, ආනයනය කරනු ලබන අර්තාපල් කිලෝ ග්‍රෑම් 1ක් සඳහා එතෙක් පැවති රුපියල් 50.00 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 60.00 ක් දක්වාත්, ආනයනික ලොකු ළූණු කිලෝ ග්‍රෑම් 1ක් සඳහා රුපියල් 10.00 ක් ව පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 30 ක් දක්වාත් සංශෝධනය කිරීම සුදුසු බවට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කරන ලද නිර්දේශයන් ද පදනම් කර ගෙන, ආනයනික අර්තාපල් සහ ආනයනික ලොකු ළූණු කිලෝ ග්‍රෑමයක් සඳහා පිළිවෙළින් රුපියල් 60.00 ක් සහ රුපියල් 30.00 ක් වශයෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් 2024 ඔක්තෝම්බර් මස 03 දින සිට නොවැම්බර් මස 30 දින දක්වා ක්‍රියාත්මක කිරීමට නියම කරන ලද අතර, එම නියමය 2024 ඔක්තෝබර් මස 02 දිනැති අංක 2404/19 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබීය. ඒ අනුව එම ගැසට් නිවේදනයේ වලංගු කාලය 2024 නොවැම්බර් මස 30 දිනයෙන් අවසන් වේ.

2. මේ වන විට ලොකු ළූණු වෙළඳපළ මිලෙහි කැපී පෙනෙන ඉහළ යාමක් නිරීක්ෂණය වන අතර, පවතින කාලගුණික තත්ත්වය මත සහ සෑම වර්ෂයකම එළඹෙන උත්සව සමය මුල්කරගෙන අර්තාපල් ඇතුළු අනෙකුත් එළවළු මිල ඉහළයාමට ඇති ප්‍රවණතාවයක් දක්නට ඇත.

3. ඉහත තත්වයන් සැලකිල්ලට ගෙන, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය සහ වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපාකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් කර ඇති නිර්දේශයන් පිළිබඳව සලකා බලා, ආනයනය කරනු ලබන අර්තාපල් කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 60 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද එලෙසම පවත්වා ගැනීමටත්, ආනයනික ලොකු ළූණු සඳහා පැවති රුපියල් 30 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 10 ක් දක්වා අඩුකිරීමටත් තීරණය කර, එම නියමය 2024 නොවැම්බර් මස 30 දිනැති අංක 2412/38 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර ඇති අතර, එම ගැසට් නිවේදනයේ සඳහන් නියමයන් 2024 දෙසැම්බර් මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මකව පවතී.

4. ඒ අනුව, දේශීය ගොවියා ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයාට සාධාරණ මිලක් ඇති වන පරිදි, කෙටිකාලීන පියවරක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම 2024 නොවැම්බර් මස 30 වන දිනයෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය අවසන් වන, අර්තාපල් සඳහා දැනට ක්‍රියාත්මක විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ නියමය එලෙසම <u>2024 දෙසැම්බර් මස 31 දින දක්වා</u> පවත්වාගෙන යාමටත්, ලොකු ළූණු සඳහා පැවති රුපියල් 30 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 10 ක් දක්වා අඩුකර <u>2024 දෙසැම්බර් මස 31 දින දක්වා</u> ක්‍රියාත්මක කිරීමටත්, ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත ඒ සඳහා සුදුසු නීතිමය විධිවිධාන යටතේ කටයුතු කිරීමටත් පියවර ගනු ඇත.